www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප සහ සසජාශි මැයි දින රැස්වීමක් පවත්වයි

## Sri Lankan SEP and ISSE to hold May Day meeting

2010 අප්‍රේල් 24

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) ව්‍යාපාරය ජාත්‍යන්තර කම්කරු දිනය සමරනු වස් මැයි 1 දා කොලඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

ආන්ඩු 1930 ගනන්වලින් මෙපිට පැවති දරුනුම ආර්ථික අර්බුදයේ බර ඔවුන් මත හෙලීමට ප්‍රයත්න දරන හෙයින් ලොව පුරා කම්කරු පන්තිය සිය රැකියාවන්ට, වැටුප්වලට හා ජීවන මට්ටම්වලට එරෙහි තීව්‍ර කෙරෙන ප්‍රහාරයන්ට මුහුන දී සිටී. ග්‍රීසිය තුල ක්‍රියාවට දැමෙන දරුනු කප්පාදු පිලිවෙත් රටක් රටක් පාසා අනුගමනය කෙරෙන්නේ, කම්කරුවන් සිය මූලික අයිතීන් අරක්ෂා කරගැනීමට සටන් වදින තතු යටතේ, තියුනු පන්ති ගැටුම් සඳහා වේදිකාව සකසමිනි.

දකුනු ආසියාව මහ බලවතුන් අතර පවතින පොරයේ සංග්‍රාම භූමියක් බවට පත්ව තිබේ. එක්සත් ජනපදය සිය ප්‍රතිවාදීන්ගේ, විශේෂයෙන්ම චීනයේ වියදමින්, මැද පෙරදිග හා මධ්‍යම ආසියාව මත සිය ආධිපත්‍යය පතුරුවාලීමට යත්න දරන තතු යටතේ, ඇෆ්ඝනිස්ථානයේ ගෙනයන සිය නව-විජිතවාදී යුද්ධය දැන් පකිස්තානය තුලට පුලුල් කර තිබේ. ශ්‍රී ලංකාවේ ආන්ඩුව වැඩ කරන ජනතාවගේ ජීවන මට්ටම්වලට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි සිය ප්‍රහාරය ගැඹුරු කිරීමට සූදානම් වේ.

යුද්ධය ද ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි උත්සන්න කෙරෙන ප්‍රහාරයන් ද ගැඹුරු වන සමාජ අසමානතාව ද අවසන් කිරීමේ එකම මාවත ඒවායේ මූල හේතුව වන ධනවාදය අහෝසි කිරීමයි. ලෝක පරිමානව සැලසුම් කෙරුනු සමාජවාදී ආර්ථිකයක් සඳහා වන අරගලය තුල කම්කරුවන්ගේ ජාත්‍යන්තර එකමුතුව එයට අවශ්‍ය කෙරෙයි. සසප සහ ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය වන හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ එහි සහෝදර පක්ෂ පමනක්ම එම විප්ලවවාදී ඉදිරිදර්ශනය සඳහා සටන් වදී. අපගේ රැස්වීමට සහභාගි වී එම සාකච්ඡාවට සම්බන්ධ වන ලෙස අපි කම්කරුවන්ට, තරුනයන්ට හා බුද්ධිමතුන්ට ආරාධනා කර සිටිමු.

**දිනය හා වේලාව: මැයි 1 දා සවස 3.00**

**ස්ථානය: නව නගර ශාලාව, ග්‍රීන් පාත්, කොලඹ 7**

© www.wsws.org